සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය | පැය 02 යි
கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம்
Diagnostic Test | 02 Hours

ජීවන නිපුණතා සහ පුරවැසි අධ්‍යාපනය 1 / 11 | 7ශ්‍රේණිය
வாழ்க்கைத் திறன்கள் மற்றும் குடியுரிமைக் கல்வி | தரம் 7
Life skills & Citizenship Education 1 / 11 | Grade 7

නම - ..........................................................  විභාග අංකය - ........................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

1. මව, පියා හා දරුවන් ගෙන් පමණක් සමන්විත පවුල

   1. න්‍යෂ්ටික පවුල  11. විස්තෘත පවුල

   111. ස්ථාවර පවුල  1v. ඥාති පවුල

2. පුද්ගලයාට හිමි අයිතිවාසිකම් අතරින් සිවිල් අයිතිවාසිකමක් වන්නේ

   1. ඡන්දය ප්‍රකාශ කිරීම  11. ඡන්දය ලබා ගැනීමේ අයිතිය

   111. ජීවත් වීමේ අයිතිය  1ぃ. තමා කැමති නායකයෙක් තෝරා ගැනීමේ අයිතිය

3. පුද්ගලයෙකුගේ හා සමාජයේ සංවර්ධනයට හේතු වන හිතකර බලවේගයක් නොවන්නේ

   1. කල්‍යාණ මිත්‍රයන්  11. වෙළඳ ප්‍රචාරක දැන්වීම්

   111. හරවත් පුවත්පත්  1v. කියවීම් ශාලා

4. පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු ගුණාංගයක් වනුයේ

   1. තරගකාරිව කටයුතු කිරීමයි.  11. තමන්ගේ දියුණුව පමණක් සිතා කටයුතු කිරීම

   111. පවුලේ දියුණුව වෙනුවෙන් කැපවීම  1v. තනිව තීරණ ගැනීම

5. අයහපත් චිත්තවේග තත්ත්වයන් පාලනය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් අඩංගු පිළිතුර තෝරන්න.

1. ක්‍රීඩාවල නිරතවීම,කෑගැසීම,ආහාර ගැනීම

11. පැණි රස ආහාර ගැනීම,ඇවිදීම ,ගීත ගායනය

111. ශබ්ද නගා හැඬීම කවි ගායනය,ක්‍රීඩා කිරීම

1ഖ. ආගමික කටයුතුවල යෙදීම, ඇවිදීම,ගීත ගායනය

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( √ ) ලකුණද වැරදිනම් ( X) ලකුණද වරහන් තුළ යොදන්න.**

6. එදිනෙදා ජීවිතයේදී අප මුහුණු දෙන විවිධ බාධාවන් අභියෝග ලෙස සැලකේ (..................)

7. ආදර්ශමත් චරිතාප්‍රදාන කියවීම තුළින් ජීවිතයට වැදගත්වන ආදර්ශ ලබා ගත හැකිවේ (..................)

8. කාල සටහනකට අනුව වැඩ කිරීමෙන් අපගේ අරමුණු කරා යාමට නොහැකි වේ (..................)

9. පියාගේ බාල සහෝදරයා මෙන් ම මවගේ බාල සහෝදරියගේ ස්වාමි පුරුෂයා බාප්පා ලෙස අමතනු ලැබේ

(..................)

10. අවමංගල්‍යයකදී සුභසාධනය සපයන සංවිධානයක් ලෙස මරණාධාර සමිතිය හැඳින්විය හැකිය.

(..................)

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරිමත ලියන්න.**

(119 ,14, සම්ප්‍රදායන්, යුතුකම්, අයිතිවාසිකම්, 16, අභියෝග)

11. ශ්‍රී ලංකාව තුළ අනිවාර්යය අධ්‍යාපනය ක්‍රියාත්මක වන බැවින් වයස අවු .................. අඩු කිසිම දරුවකු පාසල් නොයවා සිටිය නොහැක.

12. යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා පවුලෙන් ඔබට ලැබෙන හිමිකම් ........................................ ලෙසි සරලව හැඳින්විය හැකිය.

13. හදිසි ඇමතුම් අංශයේ දුරකථන අංකය වන්නේ ............... යි.

14. දිර්ඝ කාලයක් තිස්සේ පැවැත ගෙන එන සිරිත් විරිත් චාරිත්‍ර ආදිය ...................... වේ.

15. පාසල් සිසුවෙකු ලෙස අයිතිවාසිකම් භුක්ති විඳිමින් .......................................... ඉටුකළ යුතුය.

අංක 16 -20 දක්වා වාක්‍යවලට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා එම අක්ෂරය වරහන තුළ ලියන්න.

| | A | | B |
|---|---|---|---|
| 16. | පුද්ගලයෙකු සුවිශේෂිව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ | ( ) | A රජයට බදු ගෙවීම |
| 17. | ජන සමාජය තුළ පවත්නා ස්වේච්ඡා සංවිධානයකි | ( ) | B දිනපතා ආගම ඇදහීම |
| 18. | අභියෝගජය ගැනීමට කළයුතු ක්‍රියාමාර්ගයකි. | ( ) | C වාණිජ බැංකුව |
| 19. | නිතිමය යුතුකමකි | ( ) | D ග්‍රාම සංවර්ධන සමිතිය |
| 20. | පවුලක දැකිය හැකි සම්ප්‍රදායකි | ( ) | E නිර්මාණ ශිලී චින්තනය |
| | | ( ) | F DNA ව්‍යුහය |
| | | ( ) | G ඡන්ද බලය |

## 11 වන කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. i. විවේක කාලයේදී යෙදි1 හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 02 ක් ලියන්න.

   ii. න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුල් ඒකකයක ඇති විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න.

   iii. ශ්‍රී ලංකා ජන සමාජය තුළ දක්නට ලැබෙන ජනවර්ග 02 ක් හා ආගම් 02 ක් නම් කරන්න.

   iv. ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග 02 ක් නම් කරන්න.

   v. වැඩ ලෝකයේ දක්නට ඇති කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා 02 ක් නම් කරන්න.

   vi. ඔබේ හැකියාවන් අදහස් නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා පාසල සපයා ඇති පහසුකම් 02 සඳහන් කරන්න.

   vii. යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග 02 ක් ලියන්න.

   viii. අසල්වැසියන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 02 දක්වන්න.

   ix. සේවක අයිතිවාසිකම් සුරක්ෂා කිරීමට යොදා ඇති විධිවිධාන 02 ක් දක්වන්න.

   x. වර්තමානයේ සෞඛ්‍යය නිතිරීති පිළිපදින ඔබ පාසල් භූමියට ඇතුළු විමේදී කළයුතු කාර්යයන් 02 ක් ලියන්න.

( 2 x 10ලකුණු 20 )

2. i. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 02 ක් නම් කරන්න. (ලකුණු 2 )

ii. පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත්වීම නිසා ඔබ දැනට ලබන ප්‍රයෝජන 03 ක් ලියන්න (ලකුණු 3 )

iii. පහත කවිය සම්පූර්ණ කරන්න.

දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු

.................................................................. ............

.................................................................. ............

.................................................................. ............ (ලකුණු 5 )

3. i. පුද්ගලයෙකු තුළ ඇතිවන චිත්තවේග තත්ත්වයන් 02 ක් සඳහන් කරන්න. (ලකුණු 2 )

ii. ඔබ තෝරාගත් චිත්තවේග අවස්ථාවන්හි පුද්ගල හැසිරීම් 03 ක් ලියන්න. (ලකුණු 3 )

iii. අයහපත් චිත්තවේගීය තත්ත්වයන් පාලනයෙන් තොරව යම්යම් අවස්ථාවල ක්‍රියාත්මක වීම නිසා සිදුවන අයහපත් ප්‍රතිඵල 03ක් ලියා දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 5 )

4. i. “දත්ත” යන්න හඳුන්වන්න. (ලකුණු 2 )

ii. අධ්‍යාපනය සඳහා දත්ත ලබා ගත හැකි මාධ්‍ය 04 ක් ලියන්න. (ලකුණු 3 )

iii. පුද්ගලයෙකු දෛනිකව අවශ්‍යවන තොරතුරු වර්ග 05 ක් ලියන්න. (ලකුණු 5 )

5. i. ඔබ තුළ පවතනි හොඳ ගති ලක්ෂණ 02 ක් නම් කරන්න. (ලකුණු 2 )

ii. ජන සමාජයේ පවත්නා අහිතකර බලවේග 03 ක් ලියන්න. (ලකුණු 3 )

iii. ඔබ අගය කරන ආදර්ශමත් චරිත 03 ක් නම් කර ඉන් එක් චරිතයක උසස් ගති ලක්ෂණ 02ක් පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 )

6. i. අයිතිවාසිකම් වල ලක්ෂණ 02 ක් නම් කරන්න. (ලකුණු 2 )

ii. පහත සඳහන් අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් නම් කරන්න.

| අයිතිවාසිකම් | යුතුකම් |
|---|---|
| අධ්‍යාපනය ලැබීම | 1) |
| කැමති ආගමක් ඇදහීම | 2) |
| අදහස් ප්‍රකාශ කිරීම | 3) |

(ලකුණු 3 )

iii. නිතීමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

# පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. | ii | 11. | අවු 14 |
| 2. | iii | 12. | අයිතිවාසිකම් |
| 3. | ii | 13. | 119 |
| 4. | iii | 14. | සම්ප්‍රදායන් |
| 5. | iv | 15. | යුතුකම් |
| 6. | √ | 16. | F |
| 7. | √ | 17. | D |
| 8. | X | 18. | E |
| 9. | √ | 19. | A |
| 10. | X | 20. | B |

(ලකුණු 2 X20 = 40)

දෙවන කොටස

1. i. චිත්‍ර ඇඳීම/කවි ගායනය/පරිසර අලංකාරය/නාට්‍යරචනා කිරීම  පිටු අංක 22

Ii. සාමාජික සංඛ්‍යාව වැඩි නිසා පවුලේ ශක්තිය වැඩිය.පවුලේ එදිනෙදා කටයුතු සඳහා ශ්‍රමය ලබා ගැනීමේ පහසුව දරුවන්ට දෙමව්පියන්ගේ මෙන්ම සෙසු සාමාජිකයන්ගේ ආදරය ආරක්ෂාව සෙනෙහස ලැබීම  පිටු අංක 03

iii. ජන වර්ග  - සිංහල,දෙමළ,මුස්ලිම්,බර්ගර්,මැලේ

iv. ආගම්  - බෞද්ධ කතෝලික /ක්‍රිස්තියානි හින්දු ඉස්ලාම්

v. ජය පරාජය සතුටෙන් විඳ දරා ගැනීම නීති ගරුකවීම විධාන පිළිපැදීම,වින්දනය හා සතුට පිටු අංක 22

vi. වී ගොවිතැන/කොරටු වගාව/සත්ත්ව පාලනය/හාල්මෝල් ආශ්‍රිත රැකියා/කිරි නිෂ්පාදනය/ගොවි නියාමක/ගොවිජන සේවා නිලධාරි

vii. නව නිපැයුම් අංශයට නිර්මාණ ඉදිරිපත් කිරීම/චිත්‍ර තරග සාහිත්‍ය සමිති රචනා තරග විවිධ කණ්ඩායම මාධ්‍ය ඒකකය හා වෙනත්

vii. යුතුකම් ඉටු කිරීම නිතිගරුක බව අන්මත ඉවසීමලපිටු අංක 62

viii. ශ්‍රමදාන කටයුතු වලදී සෙසු ආගමික උත්සවවලදී කුඹුරු වැඩ වලදී,ගෙට ගෙවැදීමක් හා වෙනත්

ix. කම්කරු නිතී/සේවක අර්ථ සාධක අරමුදල /රක්ෂණ ක්‍රම මානව හිමිකම් කොමිසම , ආයතන සංග්‍රහය

x. හොඳින් දැත් සේදීම,මුඛ ආවරණ පැලදීම,දුරස්ථභාවය රංචු නොගැසීම ,ගුරු උපදෙස් පිළිපැදීම වෙනත්

2. i. ඥාතීත්වය මත ගොඩනැගී තිබීම,සාමාජිකයන් අතර සමීප සම්බන්ධතා සාමාජිකයන් එක්

වාසස්ථානයක ජීවත් වීම

ii. අධ්‍යාපනය ලැබීම,ආරක්ෂාව ලැබීම,ආහාර හා පෝෂණය ලැබීම

iii. පහත කවිය සම්පුර්ණ කරන්න.

දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු

උතුමන් බසින් ඉටු දෙවියන් දැන ගනිමු

ඒ බැවින් නිතින් මේ දෙවියන් වැද ගනිමු

බැලුමෙන් හොඳින් ගුරු දෙගුරුන් රැක ගනිමු

(ලකුණු 5 )

3. i. සතුට /දුක/දයාව/කරුණාව/බිය/කෝපය

ii. දුක - හැඩීම ,සුසුම් හෙලීම

සතුට - සිනාසීම,නැටීම,ගී ගැයීම,ඔල්වරසන් දීම

කෝපය - මුහුණ රතුවීම , අතපය වෙව්ලීම

iii. ජීවිත හානි ,දේපල හානි, සමාජ යහපැවැත්මට හානි ඇති වීම මානසික ආතතිය වෙනත් ම් කිරීමට ලකුණු (03) විස්තරයට ලකුණු (02)

4. i. කිසියම් විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මුලාශ්‍රවේ.

ii. ගුවන් විදුලිය/රූපවාහිනිය/අන්තර්ජාල/පුවත් පත් සඟරා ආයතන

iii. කාලගුණ අනාවැකි,විනිමය අනුපාතය, වෙළෙඳපොල මිල ගණන්, වෙළඳ දැන්වීම,රාජ්‍ය නිවේදන

5. i. අවංක බව, නිහතමානි බව, පරාර්ථකාමී බව විශ්වාසී බව වෙනත් කරුණු

ii. මත්ද්‍රව්‍ය ,දුම්වැටි, නුසුදුසු වීඩියෝ, නුසුදුසු පොත් පත් 8 නොගැලපෙන මාධ්‍ය වැඩසටහන් පිටු

අංක 16

iii. කැමැති චරිත තුනක් නම් කිරීමට ලකු 03 කි. ගති ලක්‍ෂණ 02 ක් විස්තර කිරීමට ලකු 02

මද්දුම බණ්ඩාර, වීර පුරන් අප්පු ,මාටින් වික්‍රමසිංහ මහතා වැනි

6. i' සමාජීය තුළින්ම හිමිවේ යුතුකම් සමග බැදෙයි අසීමිත නොවී පවතී ආත්මාර්ථකාමීයෙන් තොර වෙයි පිටු අංක 60

ii' අධ්‍යාපනය ලැබීම - හොදින් ඉගෙනීම

කැමැති ආගමක් ඇදහීම - අන් අයගේ සිත් රිදෙන ලෙස කතා නොකිරීම

iii' අයිතිවාසිකම් සමග යුතුකම් ඉටු කිරීම නිතියට ගරු කරමින් නිති කඩ නොකර අයිතිවාසිකම් භුක්ති විදීම යහපත් සමාජයක් ගොඩ නැගීම පෙද්ගලික අයිතියක නිදහස ආරක්ෂා වීම යන කරුණු විස්තර කිරීම පිටු අංක 61

2X10 = ලකුණු 20 10X4 = 40 මුළු ලකුණු 60 + 40 = 100

(ලකුණු 5 )